සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය
## ඉතිහාසය

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 02 යි.**

## I කොටස

ι **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

(1) "VOC" සමාගමේ පෙරදිග මූලස්ථානය වූයේ,

(1) බොම්බාය (2) බතාවිය
(3) ගෝව (4) මදුරාසිය

(2) අභ්‍යන්තර භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලන්දේසීන් විසින් මෙරට ඉදිකළ ඇළ මාර්ගය වන්නේ,

(1) ඇලහැර ඇළ (2) යෝධ ඇළ
(3) හැමිල්ටන් ඇළ (4) හැවුලොක් ඇළ

(3) ක්‍රි.ව. 1602 දී උඩරට රජු මුනගැසීමට පැමිණි ප්‍රථම ලන්දේසි දූතයා වූයේ,

(1) කලන් අල්බස්
(2) සිබෙල් ද වර්ට්
(3) ජෙරාඩ් හල්ෆ්ට්
(4) ජොරිස් වැන් ස්පිල්බර්ජන්

(4) මෙරට ලන්දේසි අධිකරණ පද්ධතියේ ඉහළම උසාවිය වූයේ,

(1) රාද් වැන් ජස්ටිටි (2) පිස්කල් උසාවි
(3) සිවිල් රාද් (4) ලැන් රාද්

(5) ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම යටතේ මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කිරීම හැඳින්වූයේ,

(1) එංගලන්ත පාලනය
(2) කිරීටයේ පාලනය
(3) මදුරාසි පාලනය
(4) සමාගමේ පාලනය

(6) දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර මතභේද ඇතිවීමට බලපෑ ආසන්නතම හේතුව වූයේ,

(1) ඇතුන් වෙළඳාමට සීමා පැනවීම.

(2) පෘතුගීසීන්ගෙන් අල්ලාගත් බලකොටු හා ප්‍රදේශ රජුට බාර නොදීම.

(3) උඩරට රාජ්‍ය සමග වෙළඳ කටයුතු සඳහා සීමා පැනවීම.

(4) කුරුඳු තලන්නන් හට නීති පැනවීම.

(7) ක්‍රි.ව. 1815 උඩරට ගිවිසුම අත්සන් කිරීමට පෙර මහනුවර මගුල් මඩුවේ දී ඉංග්‍රීසි කොඩිය බිම දමනු ලැබුවේ,

(1) වාරියපොල සුමංගල හිමි

(2) වලානේ සිද්ධාර්ථ හිමි

(3) කඩහපොල හිමි

(4) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

(8) කුණ්ඩසාලේ කුමාරයා නමින් ප්‍රකට කන්ද උඩරට රාජ්‍යයේ අවසාන සිංහල රජතුමා වූයේ,

(1) පළමුවන විමලධර්මසූරිය රජු

(2) දෙවන රාජසිංහ රජු

(3) රාජාධිරාජසිංහ රජු

(4) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

(9) ණය බර අඩු කොට ගොවි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින් වර්ෂ 1911 දී ආරම්භ කරන ලද්දේ,

(1) සමෘද්ධි ව්‍යාපාරය

(2) සමූපකාර සමිති ව්‍යාපාරය

(3) ජනසවිය ව්‍යාපාරය

(4) ජනසුවය ව්‍යාපාරය

(10) ක්‍රි.ව. 1900 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීමට මූලිකත්වය ගත් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූයේ,

(1) ෆෙඩ්රික් නෝර්ත් (2) තෝමස් මෙට්ලන්ඩ්

(3) විලියම් මැනිං (4) වෙස්ට් රිජ්වේ

(11) ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් බදු එකතු කිරීම සඳහා අවුමිල්දාර්වරුන් මෙරටට ගෙන්වාගත ප්‍රදේශය වන්නේ,

(1) දිල්ලිය (2) කල්කටාව

(3) මදුරාසිය (4) බොම්බාය

(12) වර්ෂ 1818 ප්‍රථම නිදහස් සටන මැඩලීමට ඉංග්‍රීසීන් අනුගමනය කළ ක්‍රියාමාර්ගයක් වූයේ,

(1) බිම්පාළු ප්‍රතිපත්තිය (2) වෙඩි තැබීම

(3) පහර දීම (4) හදිසි නීතිය පැනවීම

(13) මැලේරියා රෝගය සඳහා අවශ්‍ය 'ක්විනින්' නමැති ඖෂධය නිපදවූ ශාකය වූයේ,

(1) තේ (2) සිංකෝනා

(3) කොකෝවා (4) කුරුඳු

(14) මෙරට කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා ගොවිජනපද ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ,

(1) අනගාරික ධර්මපාල තුමා

(2) ඩී.බී. ජයතිලක මහතා

(3) ඩී. එස්. සේනානායක මහතා

(4) ඩඩ්ලි සේනානායක මහතා

(15) ලන්දේසීන් විසින් ආගම් ප්‍රචාරය සඳහා මෙරටේ ආරම්භ කළ ආයතනය වූයේ,

(1) ඉස්කෝල (2) පාසල

(3) මීසම (4) පාඨශාලාව

(16) මිෂනාරි පූජකවරුන් සමඟ ප්‍රසිද්ධ වාද පැවැත්වීමේ දී මූලිකත්වය ගන්නා ලද්දේ,

(1) පූජ්‍ය වස්කඩුවේ සුභූති හිමි (2) පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

(3) පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමි (4) පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

(17) හින්දු පුනර්ජීවන ව්‍යාපාරයේ පුරෝගාමියෙකු වූ පොන්නම්බලම් රාමනාදන් මහතා තම පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉදිකර වූ පාසලක් වන්නේ,

(1) සහිරා විද්‍යාලය (2) ශිවන්ගල විද්‍යාලය

(3) ශෛව ප්‍රකාශ් විද්‍යාලය (4) පරමේෂ්වර විද්‍යාලය

(18) අනුරාධපුරයේ නටඹුන්ව ගිය බෞද්ධ පූජනීය ස්ථාන ආරක්‍ෂා කර ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ බෞද්ධ නායකයා වූයේ,

(1) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා (2) ආතර් වී දියෙස් මහතා

(3) පියදාස සිරිසේන මහතා (4) ජෝන් ද සිල්වා මහතා

(19) පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් පිහිටුවනු ලැබූ පිරිවෙන වූයේ,

(1) රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන (2) කැරගල පද්මාවතී පිරිවෙන

(3) මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන (4) පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන

(20) ටජ්මහල් නම් ලොව සුප්‍රකට නිර්මාණය ඉදිකරවන ලද්දේ,

(1) ජහන්ගීර් රජු (2) ඖරංසෙබ් රජු

(3) මහා අක්බාර් රජු (4) ෂා ජහන් රජු

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **තවත් ප්‍රශ්න 04ක් තෝරාගෙන පිළිතුරු ලියන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.**

(01) පහත දැක්වෙන ලංකා සිතියමෙහි A, B, C, D, E, හා F යනුවෙන් නම් කර ඇත. එම ස්ථාන හඳුනාගෙන ඒ ඒ ස්ථානයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ ලියන්න.

(i) යාපනය


(ii) මහනුවර

(iii) වලවේ ගඟ

(iv) ත්‍රිකුණාමලය

(v) ගාල්ල

(vi) මඩකළපුව




(02) (i) ලන්දේසීන් සමඟ වර්ෂ 1638 දී හා 1766 දී ගිවිසුම් අත්සන් කරන ලද උඩරට රජවරුන් දෙදෙනා පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ලන්දේසීන් යටතේ පැවති ප්‍රධාන කොමාන්ඩරි දෙකක් හඳුන්වන්න. (ලකුණු 02)

(iii) මෙරට ජනතාව රෙපරමාදු ආගමට හරවාගැනීම සඳහා ලන්දේසීන් ගත් ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ලකුණු 03)

(iv) ඉංග්‍රීසීන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමුවීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) A - ශ්‍රී ලංකාවේ අවසාන ලන්දේසි ආණ්ඩුකාරවරයා

B - මුහුදුබඩ පාලනයට පත්ව ආ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ලකුණු 02)

(ii) පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් වර්ෂ 1796 දී මුහුදුබඩ ජනතාවට පනවන ලද නව බදු වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) උඩරට රාජ්‍ය සමඟ දූත සබඳතා පැවැත්වීමට පැමිණි ඉංග්‍රීසි දූතයින් තිදෙනා පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03)

(iv) ලන්දේසීන් හඳුන්වා දුන් තෝම්බු වර්ග තුන නම් කර ඉන් එක තෝම්බුවක සඳහන් කර තිබූ තොරතුරු සඳහන් කරන්න. (ලකුණු 05)

(04) (i) වර්ෂ 1798 දී රාජාධිරාජසිංහ රජුගේ අභාවයෙන් පසු උඩරට රාජ්‍යත්වයට උරුමකම් කී කුමාරවරුන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

(ii) ක්‍රි.ව. 1848 දෙවන නිදහස් අරගලයේ නායකයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(iii) ක්‍රි.ව. 1818 ප්‍රථම නිදහස් සටනට තුඩුදුන් හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iv) ක්‍රි.ව. 1848 දෙවන නිදහස් අරගලයේ ප්‍රතිඵල තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) ක්‍රි.ව. 1818 ප්‍රථම නිදහස් සටනේ නායකයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) ප්‍රථම හා දෙවන නිදහස් සටන් ඇතිවීමට තුඩුදුන් ආසන්නතම හේතු දෙක ලියන්න. (ලකුණු 02)

(iii) වර්ෂ 1850 න් පසු මෙරට වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට උනන්දු වූ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරුන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(iv) මෙරට රබර් වගාවේ උන්නතියට බලපෑ හේතු තුනක් ලියන්න. (ලකුණු 05)

(06) (i) A - තේ හා B - කෝපි වගාවන් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් යුරෝපීය ජාතිකයින් දෙදෙනා පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(ii) බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරටට පැමිණි මිෂනාරි සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) පහත සඳහන් වැවිලි බෝගයන්හි සංවර්ධනය සඳහා ආරම්භ කළ පර්යේෂණ ආයතන පිහිටි ප්‍රදේශ හඳුන්වන්න.

A - තේ

B - රබර්

C - පොල් (ලකුණු 03)

(iv) මෙරට බෞද්ධ අධ්‍යාපනයේ හා ආගමික පුනර්ජීවනය උදෙසා හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගෙන් සිදුවූ සේවාවන් තුනක් කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05)

(07) (i) A - ගාල්ලේ ලංකෝපකාර මුද්‍රණාලය පිහිටුවීම.

B - කොළඹ තරුණ බෞද්ධ සංගමය පිහිටුවීම.

ඉහත A හා B පිහිටුවීමට මූලිකත්වය ගත් දේශමාමකයින් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

(ii) බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) අනගාරික ධර්මපාලතුමාගේ ජාතික සේවාවන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iv) A - ආරුමුග නාවලර්තුමාගේ සේවාවන් දෙකක් ද

B - එම්. සී. සිද්දි ලෙබ්බේ මහතාගේ සේවාවන් දෙකක් ද

සඳහන් කරන්න. (ලකුණු 05)

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය
## ඉතිහාසය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. (2) | 6. (2) | 11. (3) | 16. (2) |
| 02. (3) | 7. (1) | 12. (1) | 17. (4) |
| 03. (4) | 8. (4) | 13. (2) | 18. (1) |
| 04. (1) | 9. (2) | 14. (3) | 19. (3) |
| 05. (3) | 10. (4) | 15. (1) | 20. (4) |

(ලකුණු 2 × 20)

## II කොටස

(01) (i) D (ii) C (iii) B
(iv) A (v) F (vi) E
(ලකුණු 2 × 6)

(02) (i) 1638 දෙවන රාජසිංහ
1766 කීර්ති ශ්‍රී රාජසිංහ (ලකුණු 02)

(ii) කොළඹ, ගාල්ල, යාපනය (ලකුණු 02)

(iii)
- පාසල් අධ්‍යාපනය
- රජයේ තනතුරු ලබදීම
- නම්බුනාම ලබාදීම (ලකුණු 03)

(iv)
- ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම
- ත්‍රිකුණාමලය වරායේ වැදගත්කම
- වෙළඳ කටයුතුවල දී ශ්‍රී ලංකාවේ තිබූ වැදගත්කම (කරුණු 03 ට ලකුණු 03)

(විස්තරයට ලකුණු 02)

(03) (i) A ෆන් එංගල් බෙක්
B ෆෙඩ්රික් නෝර්ත් (ලකුණු 02)

(ii) පොල්ගස් බද්ද, ලුණු බද්ද, මාළු බද්ද
දුම්කොළ බද්ද (ලකුණු 02)

(iii) ජෝන් පයිබස්, හියුබොයිඩ්,
රොබට් ඇන්ඩෲස් (ලකුණු 03)

(iv) පවුල්/ ඉඩම්/ පාසල් තෝම්බු
- පාසල් ගමක වාසය කරන දෙමාපියන්ගේ නම්, දරුවන්ගේ උපන්දින, පාසල් හැරගිය දිනය, වෙනත් ගමක පදිංචියට ගියේ නම් විස්තර
- ඉඩම් ගමේ පවුල්වල විස්තර, ඉඩම්/ වැවිලි වර්ග, සමාගමට අයවිය යුතු බදු මුදල
- පවුල් ගමක වාසය කරන පවුල්වල විස්තර

(ලකුණු 05)

(04) (i) කන්දසාමි හා මුත්තුසාමි (ලකුණු 02)

(ii) ගොංගාලේ ගොඩබණ්ඩා, පුරන් අප්පු,
කඩහලෙපාල හිමි, ඩිංගි රාළ (ලකුණු 02)

(iii)
- රජෙකු නොමැති වීම නිසා ජනතාවට ඇති වූ කලකිරීම.
- ඉංග්‍රීසි පාලනය නිසා බුදු දහම විනාශ වෙතැයි බියක් ඇති වීම.
- රදළ ප්‍රධානීන්ගේ බලතල, වරප්‍රසාද හා ආදායම් සුරක්ෂිත නොවීම.
- ඉංග්‍රීසීන් දේශීය සම්ප්‍රදායන් හා සිරිත් විරිත් නොසලකා හැරීම.
- වෙල්ලස්ස ප්‍රදේශයේ මඩිගෙ මුහන්දිරම් වශයෙන් හජ්ජි මරික්කාර් නමැති මුස්ලිම් ජාතිකයා පත් කිරීම.

(ලකුණු 03)

(iv)
- සටන අවසානයේ බේලිගේ මූලිකත්වයෙන් කමිටුවක් පත් කිරීම.
- ටොරින්ටන් ආණ්ඩුකාරවරයා හා යටත්විජිත භාර ලේකම් එමර්සන් ටෙනන්ට් තනතුරුවලින් ඉවත් කර එංගලන්තයට ආපසු කැඳවීම.
- වෙළඳසැල් බද්ද සහ බලු බද්ද අවලංගු කර මුද්දර/ තුවක්කු හා ඇග බද්ද සංශෝධනය කිරීම.
- කෘෂිකර්මාන්තය හා වාරිමාර්ග කටයුතු දියුණු කිරීම.
- දළදා වහන්සේගේ භාරකාරත්වය නැවත බ්‍රිතාන්‍ය ආණ්ඩුව සතු වීම.

(කරුණු 03 ට ලකුණු 03)
(විස්තරයට ලකුණු 02)

**Answer**

(05) (i) මොණරවිල කැප්පිටිපොළ, මඩුගල්ලේ දිසාව, කිවුලෙගෙදර මොහොට්ටාල, බූටැවේ රටේ රාල, කොහුකුඹුරේ රාල, පිළිමතලාවේ දෙවන අධිකාරම් (ලකුණු 02)

(ii) 1818 වෙල්ලස්සේ මඩිගේ මුහන්දිරම් ලෙස හජ්ජි මරික්කාර් පත්කිරීම.
1848 ටොරින්ටන් ආණ්ඩුකාරවරයා පැනවූ නව බදු
(ලකුණු 02)

(iii) හෙන්රි වෝඩ්, විලියම් ග්‍රෙගරි, ආතර් ගෝඩන්, හර්කියුලිස් රොබින්සන්
(ලකුණු 03)

(iv)
- පළමුවන ලෝක යුද්ධයෙන් පසු ලෝක වෙළඳපොළේ රබර් මිල ඉහළ යාම.
- මෙරට නිපදවූ රබර් සඳහා ඇ.එ. ජනපදයේ විශාල ඉල්ලුමක් ඇතිවීම.
- යුරෝපයේ මෝටර් රථ කර්මාන්තය දියුණුවට පත්වීම සහ රබර්වලට ඇති ඉල්ලුම ඉහළ යාම.
- රබර් වගාව සඳහා වඩාත් උචිත පසක් සහ දේශගුණ තත්ත්වයක් මෙරට පැවතීම.

(කරුණු 03 ට ලකුණු 03)
(විස්තරයට ලකුණු 02)

(06) (i) A - ජේම්ස් ටේලර්
B ජෝර්ජ් බර්ඩ් (ලකුණු 02)

(ii) ලන්ඩන මිෂනාරි සමාගම, බැප්ටිස්ට් මිෂනාරි සමාගම, වෙස්ලියන් මිෂනාරි සමාගම, ඇමරිකන් මිෂනාරි සමාගම, චර්ච් මිෂනාරි සමාගම
(ලකුණු 02)

(iii) A - තලවකැලේ
B - අගලවත්ත
C - ලුණුවිල (ලකුණු 03)

(iv)
- බෞද්ධ පාසල් පිහිටුවීම. උදා : කොළඹ ආනන්ද, මහනුවර ධර්මරාජ...
- ඉරුදින දහම්පාසල් ඇරඹීම.
- වෙසක් පෝය රජයේ නිවාඩු දිනයක් කිරීම.
- බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම.
- සරසවි සඳරුස පුවත්පත ඇරඹීම.

(කරුණු 03 ට ලකුණු 03)
(විස්තරයට ලකුණු 02)

(07) (i) A - පූජ්‍ය බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමි
B ඩී. බී. ජයතිලක මහතා (ලකුණු 02)

(ii)
- පිරිවෙන් පිහිටුවීම.
- මුද්‍රණාල පිහිටුවීම හා මුද්‍රිත මාධ්‍ය යොදා ගැනීම.
- වාද විවාද පැවැත්වීම.
- බෞද්ධ පාසල් පිහිටුවීම.
- දේශීය සංස්කෘතිය ආරක්ෂා කරගැනීමට කටයුතු කිරීම.

(ලකුණු 02)

(iii)
- බෞද්ධ පාසල් පිහිටුවීම. උදා : කොළඹ ආනන්ද බාලිකා, පන්නිපිටියේ ධර්මපාල....
- මහාබෝධි සංගමය පිහිටුවා බුද්ධගයාව රැකගැනීම.
- සිංහල බෞද්ධයා හා මහාබෝධි සඟරාව ආරම්භ කිරීම.
- දේශීය සංස්කෘතිය රැකගැනීම.
- අමද්‍යප ව්‍යාපාරයට නායකත්වය දීම.

(ලකුණු 03)

(iv) A -
- හින්දු ආගමික පුනරුදයට නායකත්වය දීම.
- යාපනයේ හින්දු විද්‍යාලය ඇතුලු පාසල් රැසක් පිහිටුවීම.
- ග්‍රන්ථ රැසක දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.
- හින්දු ආගම, සාහිත්‍ය හා සංස්කෘතිය රැකගැනීමට නායකත්වය දීම.
- උදයභානු පුවත්පත ඇරඹීම.

B
- ඉස්ලාම් ආගමික පුනරුදයට නායකත්වය දීම.
- මුස්ලිම් නෙයිසන් පුවත්පත ඇරඹීම.
- කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීම.

(කරුණු 03 ට ලකුණු 03)
(විස්තරයට ලකුණු 02)